අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය
நீதிச்சேவை ஆணைக்குழுச் செயலகம்
**Judicial Service Commission Secretariat**

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT

මගේ අංකය / எனது இலக்கம் / My No. JSC/SEC/JTI/2025
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 21.08.2025

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 422 A

සියලුම දිසා විනිසුරුවරුන් හා මහේස්ත්‍රාත්වරුන් වෙත,

<u>අධිකරණවල ගොඩගැසී පවතින නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම සම්බන්ධවයි</u>

අධිකරණවල ගොඩගැසී පවතින නඩු භාණ්ඩ කඩිනමින් නිශ්කාෂණය කිරීමේ අවශ්‍යතාවය අධිකරණ සේවා කොමිෂන් සභාවේ දැඩි අවධානයට ලක්ව ඇති අතර එය 2025.12.31 දින හෝ ඊට පෙර අවසන් කිරීමට අනිවාර්යයෙන්ම කටයුතු කලයුතු බවට තීරණය කොට ඇත.

02. අධිකරණවල ගොඩගැසී පවතින නඩු භාණ්ඩ සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීමට අදාලව නිකුත් කොට ඇති ඉහත සමාංක හා 2025.05.08, 2025.07.31 සහ 2025.08.12 දිනැති ලිපි මඟින් ඉල්ලා ඇති තොරතුරු ඇතැම් අධිකරණ විසින් මේ වන විට යොමුකොට ඇතත් එම වාර්තා වල අන්තර්ගත ඇතැම් තොරතුරු ප්‍රමාණවත් නොවන බවට, හා නිවැරදි නොවන බවට නිරීක්ෂණය වී ඇත.කෙසේ වුවද සියළු දත්ත විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාවය මත එම සියලුම වාර්තා වල මෘදු පිටපත්(soft copies) 2025.08.25 දින හෝ ඊට පෙර itdeptjsc@gmail.com හා slji.information@gmail.com වෙත යොමු කිරීමට පියවර ගත යුතුය.දෘඩ පිටපත් හා මෘදු පිටපත් නියමිත දිනට යොමුකිරීමට කටයුතු කොට නොමැති නිලධාරීන් සම්බන්ධව දැඩිව ක්‍රියා කරනු ඇත.

03. ඒ ඒ අධිකරණවල පරිපාලනමය වගකීම පැවරී ඇති දිසා විනිසුරුවරු හා මහේස්ත්‍රාත්වරුන් සේම එම අධිකරණවල සේවය කරන අතිරේක දිසා විනිසුරු (මහේස්ත්‍රාත්වරුන් ලෙස කටයුතු කරන) හා අතිරේක මහේස්ත්‍රාත්වරු තම තමාගේ අධිකරණයේ පවතින නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීමේ ඍජු වගකීමට යටත්වන බව අවධාරණය කරනු ලැබේ.දැනට ඔබ විසින් ඉදිරිපත් කොට ඇති නඩු භාණ්ඩ සම්බන්ධ වාර්තාවට පසුව එක් එක් අධිකරණයේ ගොඩගැසෙන නඩු භාණ්ඩ සම්බන්ධව ඒ ඒ විනිසුරුවරුන්/වරියන් වගකීමට යටත් වන බවටත්, වාර්ෂික වැටුප් වර්ධක සලකා බැලීමේදී හා ස්ථාන මාරු සලකා බැලීමේදී අතිරේක දිසා විනිසුරුවරු(මහේස්ත්‍රාත්වරුන් ලෙස කටයුතු කරන) හා අතිරේක මහේස්ත්‍රාත්වරුන්ගේ ක්‍රියාකාරීත්වය දැඩිව සැලකිල්ලට ගන්නා බවටත් දන්වා සිටිමි.තවද මෙම අරමුණ සාර්ථක කිරීම සඳහා ඔබ විසින් ගනු ලබන පියවර හා ප්‍රගතිය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ස්ථාන නිරීක්ෂණයන් මඟින් සොයා බලන බවත් මාසිකව ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් 2025.09.30, 2025.10.31, 2025.11.28 හා 2025.12.31 දින වලදී අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙසට නියම කරමි.අංක 422 චක්‍රලේඛය නිවැරදි ලෙස ක්‍රියාවට නැංවීම සඳහා සියලු විනිසුරුවරුන් වෙත වන වගකීම අවධාරණය කරනු ලැබේ.

04. නඩු භාණ්ඩ පිළිබඳව වන නිවැරදි වාර්තා සැකසීම සහ නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම සම්බන්ධව නඩු භාණ්ඩ භාරකරු ප්‍රමුඛ කාර්ය මණ්ඩලය, ලේඛනාගාර භාරකරු ප්‍රමුඛ කාර්ය මණ්ඩලය, රෙජිස්ට්‍රාර්වරු/වරියන් ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයේ පුද්ගලික හා සාමූහික වගකීම අවධාරණය කරනු ලබන අතර මෙකී නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම සම්බන්ධයෙන් පවරන රාජකාරි ඉටුනොකරන හා සහාය නොදක්වන කාර්ය මණ්ඩලයේ සියලුම සේවකයන් සම්බන්ධයෙන් දැඩිව කටයුතු කරන බව දන්වා සිටිමි.



තැ.පෙ. 573, අළුත් කඩේ, කොළඹ 12. த.பெ.இல. 573, புதுக்கடை, கொழும்பு 12. P.O. Box 573, Hulftsdorp, Colombo 12.
ලේකම් / செயலாளர் / Secretary (+94) 11 2321104
කාර්යාලය / அலுவலகம் / Office (+94) 11 2433119 / 2451159
(+94) 11 2446111
jscinformaion@jsc.gov.lk
www.jsc.gov.lk

05. මෙකී නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම 2025.12.31 වන විට අවසන් කිරීම සඳහා ඔබගේ අධිකරණ සංකීර්ණයේ පවතින සෙසු අධිකරණවල විනිසුරුවරුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ පූර්ණ සහාය අවශ්‍යතාවය පරිදි,එම අධිකරණ විනිසුරුවරුන් සමඟ සාකච්ඡා කොට ලබා ගැනීමට කටයුතු කලහැකි බව දන්වා සිටිමි.

06. මේ වන විටත් මෝටර් රථ පරීක්ෂක වාර්තා කඩිනමින් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට දැනුම් දී ඇති බවත්, පොලිසිය හා අධිකරණ අමාත්‍යාංශය විසින් අවශ්‍ය පහසුකම් සැලසීමට දැනුම් දී ඇති බවත්, අධිකරණ කාර්ය මණ්ඩලය හැර අමතර පිරිස් බලය අවශ්‍ය වන්නේ නම් ඔබගේ අධීක්ෂණය යටතේ අවශ්‍ය සේවාවන් ඉටුකර ගැනීමට පිරිස් බලය ඔබ විසින් ඉල්ලා සිටින පරිදි ලබාදීමේ හැකියාවක් පවතින බවත් දන්වමි. මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙතින් ලබා දිය හැකි උපරිම සහයෝගය ලබාදිය හැකි බවද දන්වමි. දැනට අධිකරණවල ගොඩ ගැසී ඇති නඩු භාණ්ඩ නිශ්කාෂණය කොට අධිකරණ පරිශ්‍ර පිරිසිදුව පවත්වා ගැනීම සඳහා ද, නැවත නඩු භාණ්ඩ ගොඩ නොගැසෙන පරිදි කටයුතු කිරීම සඳහා ද වහාම ක්‍රියාත්මක විය යුතු බවද ඔබට දැන්වීමට මට නියම කර ඇත.

07. අධිකරණ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කටයුතු හා පහසුකම් සැලසීම උදෙසා පත්කිරීමට නියමිත, අතිරේක ලේකම් (විනිසුරු) වෙත දුරකතන අංක 0112421676 යටතේ සම්බන්ධ විය හැකි බවත්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සම්බන්ධීකරණ කටයුතු හා පහසුකම් සැලසීම උදෙසා විනිසුරු, ඩී.එම්.ජේ. දිසානායක මහතා වෙත දුරකතන අංක 0759980930 යටතේ සම්බන්ධ විය හැකි බවත් දන්වා සිටිමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

ANNEXE

# නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම

## පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01. | නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීමේ චක්‍රලේඛයට අදාල ආවරණ ලිපිය. | I - IV |
| 02. | නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම සම්බන්ධයෙන් වන අංක 422 දරණ අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛය. | 1 – 14 |
| 03. | අධිකරණ තුළ ගොඩ ගැසී ඇති පාපැදි නියාදනය කාර්යක්ෂම කිරීම සඳහා වන අංක MOJ/E12/න.භා./විවිධ/2013 සහ 2013.12.09 දිනැති අධිකරණ අමාත්‍යාංශ අංක 5/2013 දරණ චක්‍රලේඛය. | 15 – 16 |
| 04. | රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා වන අංක MOJ/AC/21/වෙන්දේසි/පොදු/2017 සහ 2018.07.31 දිනැති අධිකරණ අමාත්‍යාංශ අංක 08/2003(II) දරණ චක්‍රලේඛය. | 17 |
| 05. | රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා වන අංක MOJ/AC/21/2017/පොදු (I) සහ 2018.09.11 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 08/2003 (II) ට අදාලව නිකුත් කර ඇති චක්‍රලේඛ ලිපිය. | 18 |
| 06. | 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 432 වන වගන්තිය. | 19 |
| 07. | 2016 අංක 18 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 432 වන වගන්තිය. | 20 – 22 |
| 08. | නඩු භාණ්ඩ ලෙස ඇති දැව අපරාධවලට සම්බන්ධ උපකරණ නියාදනය කිරීම සඳහා වන අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්ගේ ජේඑස්සී/එස්ටී/එම්අයිඑස්සී/2011 හා 2011.09.26 දිනැති චක්‍රලේඛ ලිපිය. | 23 |
| 09. | 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 420 වන වගන්තිය. | 24 |

මගේ අංකය - JSC/SEC/CIR/2018

සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ

සියළුම අධිකරණ නිලධාරීන් වෙත.

**නඩු භාණ්ඩ නිෂ්කාෂනය කිරීම සම්බන්ධවයි.**

බොහෝ අධිකරණ පරිශ්‍රයන්හි නඩු භාණ්ඩ විශාල වශයෙන් ගොඩ ගැසී රඳවා ඇති බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට ලක් වී ඇත.

ඒ හේතුවෙන්,

- ❖ අධිකරණ පරිශ්‍රවල ඉඩකඩ බොහෝ සෙයින් ඇහිරී යාම,
- ❖ අධිකරණ පරිශ්‍ර පිරිසිදුව හා පිළිවෙලකට තබා ගැනීමට නොහැකි වීම,
- ❖ නඩු භාණ්ඩවල වටිනාකම ක්ෂයවීම හේතුවෙන් හා ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ අනවශ්‍ය ලෙස රඳවා තැබීමෙන් මහජන මුදල් අපතේ යාම සහ රජයට ලැබිය යුතු මුදල් නොලැබී යාම,
- ❖ නඩු භාණ්ඩවල කොටස්/උපාංග අස්ථානගත වීම සහ වෙනත් වැරදි ක්‍රියාවන්ට භාජනය වීමේ අවදානමකට ලක්වීම,
- ❖ අධිකරණවල ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු සහගත තත්වයන් උද්ගත වීම,
- ❖ ඩෙංගු වැනි රෝග බෝවීමේ අවදානමක් ඇතිවීම,

වැනි බොහෝ අහිතකර තත්වයන් උද්ගත වීමේ අවදානමකට ලක් වී ඇත. ඒ අනුව අධිකරණ පරිශ්‍රවල එසේ ගොඩ ගැසී රඳවා ඇති නඩු භාණ්ඩ හැකිතාක් දුරට කඩිනමින් නිෂ්කාෂනය කිරීමේ අවශ්‍යතාවය ප්‍රමුඛතා කාර්යයක් ලෙස සැලකීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා,

01. රථවාහන

02. ඇව

03. රාජසන්තක කරන ලද හෝ හිමිකම් නොපාන මත්පැන් සහ ඒවාට අදාල බහාලුම්

04. රාජසන්තක කරනු ලබන වැලි, බොරළු සහ පස්

05. ගංජා හෙවත් cannabis sativa L

යන නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති චක්‍රලේඛයේ දිනයේ සිට අනුගමනය කල යුතු ප්‍රතිපාදන අන්තර්ගත අංක 422 සහ 2018.10.08 දින දරණ අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛය නිකුත් කර ඇත. (එහි පිටපතක් මේ සමඟ අමුණා ඉදිරිපත් කර ඇත.)

ඉහතින් සඳහන් කරනු ලද නඩු භාණ්ඩවලට අමතරව, අධිකරණ පරිශ්‍ර තුල ගොඩ ගැසී ඇති පා පැදි නිශ්කාෂනය කාර්යක්ෂම කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක MOJ/E12/න.භා./විවිධ/2013 සහ 2013.12.09 දිනැතිව නිකුත් කර ඇති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 5/2013 යන චක්‍රලේඛයේ පිටපතක් ද මේ සමඟ අමුණා ඉදිරිපත් කර ඇත. (එම චක්‍රලේඛයේ 2 වන ඡේදය 2016 අංක 18 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රය පනතේ 431 හා 432 වන වගන්තිවලට යටත්ව සලකා බැලිය යුතුය.)

එසේම රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සම්බන්ධයෙන් 2018.08.15 දින සිට බලපැවැත්වෙන පරිදි "රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම" යන මාතෘකාව යටතේ නිකුත් කර ඇති අධිකරණ අමාත්‍යාංශ අංක 08/2003 (II) සහ MOJ/AC/21/2017/පොදු (1) දරණ චක්‍රලේඛයේ පිටපතක් ද, 2018.09.11 දින දරණ චක්‍රලේඛයට අදාල ලිපියේ පිටපතක් ද පහසුව සඳහා මේ සමඟ අමුණා ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මේ සමඟ අමුණා ඉදිරිපත් කර ඇති ඉහත කී චක්‍රලේඛ හා ලිපි ද, එම චක්‍රලේඛවලින් ආවරණය නොවන අනෙකුත් නඩු භාණ්ඩ සම්බන්ධයෙන් මීට පෙර අධිකරණ සේවා කොමිෂන් සභාව සහ අධිකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ ලිපිවල අඩංගු ප්‍රතිපාදනයන්ද අනුගමනය කරමින්, නඩු විභාගය අවසන් වන තෙක් බැහැර කිරීමකින් තොරව නීතිමය වශයෙන් අනිවාර්යයෙන්ම රඳවා තබා ගත යුතු ලෙසට තීරණය කරනු ලබන නඩු භාණ්ඩ හැරුණු කොට, අනෙකුත් සියලු නඩු භාණ්ඩ අධිකරණ භූමිවල රඳවා නොගෙන නිශ්කාෂනය කොට බැහැර කර ඇති තත්වයකට පත් වන සේ කටයුතු කිරීම සඳහා සෑම අධිකරණ නිලධාරියෙකු විසින්ම අනිවාර්යයෙන්ම නොපමාව ක්‍රියා කල යුතු වේ.

ඒ සඳහා පහත පරිදි ක්‍රියා කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාව අපේක්ෂා කෙරේ.

I. සෑම මහේස්ත්‍රාත් අධිකරණයකම අවසාන වූ නඩුවලට අදාලව නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම සඳහා අවම වශයෙන් ප්‍රසිද්ධ වෙන්දේසි 05 ක්වත් වාර්ෂිකව පැවැත්වීම. (ප්‍රාදේශීය වෙන්දේසිවලට අතිරේකව)

III

II. 2019 වර්ෂයේ සිට වැටුප් වර්ධකය අනුමත කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයා/අතිරේක මහේස්ත්‍රාත්වරයා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත වැටුප් වර්ධක අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ දී මෙම ලිපියේ දින සිට වැටුප් වර්ධකය යෙදෙන දින දක්වා යන කාලසීමාව තුළදී මහේස්ත්‍රාත්වරයාගේ/අතිරේක මහේස්ත්‍රාත්වරයාගේ මෙහෙයවීම මත පවත්වන ලද ප්‍රසිද්ධ වෙන්දේසි/ ප්‍රාදේශීය වෙන්දේසිවලට අදාලව වෙන්දේසි වාර්තාවල පිටපත් සම්පූර්ණ කරන ලද වැටුප් වර්ධක අයදුම් පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කල යුතු වේ. වැටුප් වර්ධකය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී වැටුප් වර්ධක වර්ෂයක කාලසීමාව තුල පවත්වා ඇති ප්‍රසිද්ධ වෙන්දේසි/ප්‍රාදේශීය වෙන්දේසි සංඛ්‍යාව සහ එමගින් බැහැර කර ඇති භාණ්ඩවල ස්වභාවය සහ සංඛ්‍යාවද සලකා බලනු ලැබේ.

එච්. සංජීව සෝමරත්න.
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

පිටපත :-

(1) ලේකම්, අධිකරණ අමාත්‍යාංශය - (i) මෙම ලිපිය සහ මෙම ලිපිය සමඟ අමුණා ඉදිරිපත් කර ඇති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 422 හි අරමුණු සාර්ථක කර ගැනීම සඳහා, නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පහසුකම් සපයා දීමටත්, සෑම අවස්ථාවකදීම අධිකරණ නිලධාරීන්ට සහ/හෝ අධිකරණයේ රෙජිස්ට්‍රාර්ට සෘජුව හා පහසුවෙන් සම්බන්ධ වීමටත් හැකි සුදුසු නිලධාරියෙකු/නිලධාරිනියක අධිකරණ අමාත්‍යාංශයේ පාර්ශවයෙන් පත් කර අධිකරණ සේවා කොමිෂන් සභාවට සහ අධිකරණ නිලධාරීන්ට කඩිනමින් දැනුම්දීමත් සලකා බැලීම සඳහා.

(ii) ඉහත චක්‍රලේඛ අංක 422 ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය ඩිජිටල් කැමරා, බර කිරන තරාදි, දත්ත ගබඩා කර තබා ගැනීමට අවශ්‍ය Pen drive උපාංග, External hard disk උපාංග ආදිය අදාල අධිකරණවලට සැපයීමට අවශ්‍ය පියවර කඩිනමින් ගැනීම සලකා බැලීම සඳහා.

| | |
|---|---|
| 02. පොලිස්පති, පොලිස් මූලස්ථානය | (i) මේ සමඟ අමුණා ඇති චක්‍රලේඛය පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා.<br><br>(ii) මෙම චක්‍රලේඛ අංක 422 හි 1.1 (iii) (iv) අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා.<br><br>(iii) 1.1(v) අනුව අධිකරණ මගින් අදාල සහකාර පොලිස් අධිකාරීට හා/හෝ පොලිස් අධිකාරීට වාර්තා කිරීමේ දී ප්‍රශ්නගත රථවාහනයේ ලියාපදිංචි අයිතිකරු/පරම අයිතිකරු/සංතකයට හිමිකම් ඇති තැනැත්තකු පිළිබඳ වහාම විමර්ශණය කොට ඒ පිළිබඳව නොපමාව අධිකරණයට දැන්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනමින් සිදු වන බව සහ එය නිසි පරිදි අධීක්ෂණය වන බව සනාථ වන පරිදි ක්‍රියා කිරීමට අදාල අධීක්ෂණ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම.<br><br>(iv) මේ සමඟ අමුණා ඇති චක්‍රලේඛයේ 5.2 පරිදි ක්‍රියා කිරීමට අදාල පොලිස් නිලධාරීන්ව දැනුවත් කිරීම. |
| 03. සභාපති, ඇව සංස්ථාව | (i) මේ සමඟ අමුණා ඇති චක්‍රලේඛයේ අංක 02 අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ පහසුකම් සපයාදීම සඳහා. |

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 422

**සියළුම අධිකරණ නිලධාරීන් වෙත.**

**නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම සම්බන්ධවයි.**

මෙම චක්‍රලේඛය මගින් පහතින් සඳහන් කර ඇති නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන සපයා ඇත.

01. රථවාහන

02. ඇව

03. රාජසන්තක කරන ලද හෝ හිමිකම් නොපාන මත්පැන් සහ ඒවාට අදාල බහාලුම්

04. රාජසන්තක කරනු ලබන වැලි, බොරළු සහ පස්

05. ගංජා නොහොත් cannabis sativa L

ඒ අනුව ඉහත කී නඩු භාණ්ඩ නිශ්කාෂනය කිරීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ දිනයට ප්‍රථමයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සහ/හෝ අධිකරණ අමාත්‍යාංශය විසින් කවර උපදෙස්/නියමයන්/මගපෙන්වීම් අඩංගු කරමින් චක්‍රලේඛ/ලිපි නිකුත් කර තිබුනද, මෙම අංක 422 දරණ චක්‍රලේඛයේ දින සිට ඉහතින් දක්වා ඇති නඩු භාණ්ඩ වර්ග පහ (05) නිශ්කාෂනය කිරීම සඳහා පාදක කර ගත යුත්තේ මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන පමණක් බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වනු ලැබේ.

නඩු භාණ්ඩයක් අධිකරණයට භාර දුන් දින සිට එම නඩු භාණ්ඩය සම්බන්ධයෙන් සුදුස්සක් අධිකරණය මගින් සිදු කරන දින දක්වා වන සම්පූර්ණ කාලපරාසය තුල එම නඩු භාණ්ඩය ඕනෑම අවස්ථාවකදී ක්ෂණිකවත් නිවැරදිවත් හඳුනා ගත හැකි බව සනාථ කිරීම සඳහා, එම නඩු භාණ්ඩය අධිකරණයට භාර දුන් පොලිස් ස්ථානය/චෝදක පාර්ශවය, එම නඩු භාණ්ඩයට අදාල නඩු භාණ්ඩ අංකය ද (පී.ආර්. අංකය ද) හා එම නඩු භාණ්ඩයට අදාල නඩු අංකය ද නිරූපනය වන පරිදි ඒ ඒ අධිකරණ විසින් සාදා ගනු ලබන කේත අංකයක් සෑම නඩු භාණ්ඩයකටම ලබා දීම මෙම චක්‍රලේඛය මගින් නියම කරනු ලැබේ.

උදාහරණය :- අනුරාධපුර පොලිස් ස්ථානය මගින් අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයට භාර දුන් නඩු භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත පරිදි කේත අංකයක් අදාල කර ගත හැකි වේ.

ANU/PR………/BR………

අදාල පොලිස් ස්ථානයට ලබා දෙන කේත අංකය

අදාල පී.ආර්. අංකය

අදාල නඩු අංකය

තවද, ඉහත පරිදි සටහන් යෙදීම සඳහා නොමැකෙන තීන්ත වර්ගයක් භාවිතා කිරීම සේම හැකිතාක්දුරට නඩු භාණ්ඩයේ "අභ්‍යන්තරයේ ස්ථානයක" ඉහත විස්තරය සටහන් කිරීම කළ යුතු වේ.

## 1. රථවාහන.

1.1 රථවාහනයක් නඩු භාණ්ඩයක් වශයෙන් අධිකරණයට ඉදිරිපත් කිරීමේ දී සහ එය භාර ගැනීමේ දී පහත ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම කළ යුතු වේ.

i. රථවාහනයක් නඩු භාණ්ඩයක් ලෙස භාර ගැනීමේ දී මීට ඉහතින් සඳහන් කරන ලද කේත අංකය යටතේ එය භාර ගැනීම සිදු කරන බවට වගබලා ගැනීම.

උදාහරණයක් ලෙස:-

……………/PR………/BR………

අදාල පොලිස් ස්ථානයට ලබා දෙන කේත අංකය

අදාල පී.ආර්. අංකය

අදාල නඩු අංකය

ii. නඩු භාණ්ඩයක් වන රථවාහනයක් අධිකරණයට ඉදිරිපත් කිරීමේ දී එහි සංතකය පිළිබඳව සංක්ෂිප්ත සාරාංශයක් 'බී' වාර්තාවේ අන්තර්ගත කර ඉදිරිපත් කිරීමට සෑම විටම පොලිසියට උපදෙස් දීමටද එකී උපදෙස් පිළිපදින බවටද වගබලා ගැනීම.

iii. නඩු භාණ්ඩයක් වන රථවාහනයක් අධිකරණයට ඉදිරිපත් කරන මුල් අවස්ථාවේ දීම, අදාල වන පරිදි වරදේ ස්වභාවය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේත්, අනිකුත් අණපනත්වලත් ප්‍රතිපාදන සැලකිල්ලට ගත් විට, විමර්ශණය අවසන් වන තෙක් ප්‍රශ්නගත රථවාහනය අධිකරණය භාරයේ භෞතිකව තබා ගැනීමට මහේස්ත්‍රාත්වරයා විසින් සිය අභිමතය ක්‍රියාත්මක කරමින් තීරණය කිරීමට අගතිවිරහිතව;

එම රථවාහනය සුදුසු බැඳුම්කරයක් මත මුදා හැරීමට ඇති හැකියාව සලකා බැලීමට අවස්ථානුකූලව පරම අයිතිකරු/ලියාපදිංචි අයිතිකරු/සංතකයට හිමිකම් ඇති තැනැත්තකු හැකි සෑම අවස්ථාවකදීම පොලිසිය මගින් ඉදිරිපත් කරවා ගැනීමට වගබලා ගැනීම.

iv. ඉහත iii ඡේදය පරිදි මුදා හැරීමේ නියෝගයක් කිරීමට හැකියාව නොලැබියාමේ හේතුව එකී iii ඡේදයේ සඳහන් තැනැත්තකු ඉදිරිපත් නොවීම නම්, එකී ඡේදයේ දක්වා ඇති තැනැත්තකු සම්බන්ධයෙන් විමර්ශනය කොට අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට පොලිසියට උපදෙස් දිය යුතුය. ඒ සඳහා ප්‍රධාන නඩුවේ ඉදිරි පියවර සඳහා කවර දිනයක් නියම කලද, ප්‍රශ්නගත නඩු භාණ්ඩය නිශ්කාෂනය කිරීම සළකා බැලීම සඳහා රථවාහනය අධිකරණයට ඉදිරිපත් කල පළමු දිනයේ සිට උපරිම වශයෙන් වැඩකරන දින 7 කට නොවැඩි දිනයක් අධිකරණය විසින් නියම කොට ඒ අනුව එකී කාරණය සඳහා පමණක් නඩුව ඇමතිය යුතු වේ.

v. කෙසේ වුවත්, රථවාහනයක් නඩු භාණ්ඩයක් වශයෙන් අධිකරණයට ඉදිරිපත් කල අවස්ථාවේ සිට උපරිම වශයෙන් සති 4 ක කාලසීමාවක් තුල දී (නඩුව පවතින අතරතුරදී) එය බැහැර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට පොලිසිය අපොහොසත් වුවහොත්, එකී කාලසීමාව අවසානයේ දී ඒ බව ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරි හා/හෝ පොලිස් අධිකාරි වෙත වාර්තා කල යුතු වේ.

vi. නඩුව පවතින අතරතුර දී රථවාහනයක් බැහැර කරන සෑම විටම එහි අනන්‍යතාවය සනාථ වන පරිදි භාණ්ඩ භාර රෙජිස්ට්‍රාර් සහ/හෝ අධිකරණයේ රෙජිස්ට්‍රාර් ඉදිරියේ දී නඩු භාණ්ඩ භාරකරු විසින් එම රථවාහනය ඡායාරූප ගත කර එම ඡායාරූප නඩු වාර්තාවට ගොනු කිරීමෙන් පසුව පමණක් එය බැහැර කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. එම සෑම ඡායාරූපයක් පිටුපසම නියමිත නඩු අංකයට අමතරව එම

ඡායාරූපය ගන්නා ලද තැනැත්තාගේ නම/තනතුර සහ ඡායාරූපය ගන්නා ලද දිනයද, එය අධීක්ෂණය කරන ලද රෙජිස්ට්‍රාර්වරයාගේ ඉහත පරිදි වූ විස්තරද නොමැකෙන පරිදි සටහන් කල යුතු වේ. තවද රථවාහනයේ ලියාපදිංචි අංක තහඩුව සහ විශේෂ සලකුණු දර්ශනය වන ඡායාරූප ගැනීමත් අනිවාර්ය වේ.

**1.2 නඩුව පවතින අතරතුර දී නඩු භාණ්ඩයක් වන රථවාහනයක් බැහැර කිරීම:-**

vii. නඩුව පවතින අතරතුර දී, නඩු භාණ්ඩයක් වන රථවාහනයක් අධිකරණයට ඉදිරිපත් කරන මුල් අවස්ථාවේ දීම, වරදේ ස්වභාවය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේත් අදාල විය හැකි අනිකුත් අණපනත්වල ප්‍රතිපාදනත් සැලකිල්ලට ගත් විට විමර්ශණය අවසන් වන තෙක් ප්‍රශ්නගත රථවාහනය අධිකරණය භාරයේ භෞතිකව තබා ගැනීමට මහේස්ත්‍රාත්වරයා විසින් සිය අභිමතය ක්‍රියාත්මක කරමින් තීරණය කිරීමට අගතිවිරහිතව සහ ප්‍රශ්නගත රථවාහනය මුදා හැරීම වළක්වාලමින් අදාල විය හැකි පරිදි ඉහළ අධිකරණයක් මගින් ආඥාවක් පනවා ඇති අවස්ථාවකදී එම ආඥාව අනුව ක්‍රියා කිරීමටද අගතිවිරහිතව;

නොපමාව එම රථවාහනය සුදුසු බැඳුම්කරයක් මත අවස්ථානුකූලව එහි පරම අයිතිකරුට/ලියාපදිංචි අයිතිකරුට මුදා හැරීමට කටයුතු කල යුතු වේ. පරම අයිතිකරු සහ/හෝ ලියාපදිංචි අයිතිකරු අධිකරණයට ඉදිරිපත් නොවන අවස්ථාවක දී (සාධාරණ උත්සාහයක් දැරීමෙන් පසුව) සහ/හෝ පරම අයිතිකරුවකු/ලියාපදිංචි අයිතිකරුවකු නොමැති අවස්ථාවක දී, මහේස්ත්‍රාත්වරයා විසින් එම වාහනයේ සංතකයට හිමිකම් ඇති තැනැත්තෙකු බවට අධිකරණය සෑහීමට පත්වන තැනැත්තෙකුට සුදුසු බැඳුම්කරයක් මත අදාල රථවාහනය මුදා හැරීම කල හැකි වේ.

වාහනයේ හිමිකම පිළිබඳව විවාදයකට ලක් වී ඇති අවස්ථාවක දී ඒ සම්බන්ධයෙන් අවසානාත්මක ආඥාවක් නඩුව අවසානයේ දී සිදු කරන තෙක්, නඩුව පවතින අතරතුර දී, එය බැඳුම්කරයක් මත බැහැර කිරීම සිදු කල යුත්තේ කා වෙතද යන්න තීරණය කිරීම සඳහා, උපරිම වශයෙන් මසක කාලසීමාවක් තුල දී සුදුසු විමසීමක් පවත්වා නියෝගයක් නිකුත් කර, එසේ නියෝග කරන තැනැත්තාට සුදුසු බැඳුම්කරයක් මත මුදා හැරීම කල හැකි වේ. විශේෂිත අවස්ථාවන් හැරුනුකොට එකී කාර්ය සඳහා දිවුරුම් ප්‍රකාශ සාක්ෂි අදාල කර ගැනීම සුදුසු ක්‍රියාමාර්ගයක් වේ.

1.3 නඩු තීන්දුවෙන්/නියෝගයෙන් පසු බැහැර කිරීම:-

මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තීන්දුව/නියෝගය ප්‍රකාරව නඩු භාණ්ඩයක් වන රථවාහනය රාජසන්තක කිරීමට නියම කර ඇති නම්, ඒ අවස්ථාව වන විටත් රථවාහනය බැඳුම්කරයක් මත මුදා හැරීම කර නොමැති නම්, රාජසන්තක කිරීමේ නියෝගයෙන් පසු බැඳුම්කරයක් මත වාහනය මුදා හැරීම නොකල යුතු වේ.

කෙසේ වුවත්, මහේස්ත්‍රාත් අධිකරණයේ තීන්දුවේ/නියෝගයේ ප්‍රතිඵලය වාහනය රාජසන්තක කිරීමක් වන අවස්ථාවක දී සහ ඊට එරෙහිව අභියාචනයක්/ප්‍රතිශෝධනයක් ඉදිරිපත් කර ඇති විට එම අභියාචනය/ප්‍රතිශෝධනය අසා නිම වන තෙක්, ඒ වන විටත් බැඳුම්කරයක් මත වාහනය බැහැර කිරීම සිදු කර ඇති විටක, අදාල අභියාචනය/ප්‍රතිශෝධනය අසා නිම වන තෙක්, ඉහත පරිදි වූ බැහැර කිරීම එලෙසම පවත්වා ගැනීම කල හැකි වේ.

1.4 රාජසන්තක කර ඇති රථවාහන බැහැර කිරීම:-

රාජසන්තක කර ඇති වාහන අධිකරණ අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති, තත්කාලයේ බලපවත්නා ප්‍රතිපාදන ප්‍රකාරව වෙන්දේසි කිරීම හෝ ටෙන්ඩර් කිරීම මගින් විකිණීමෙන් කඩිනමින් බැහැර කිරීම සිදු කල යුතු වේ.

1.5 හිමිකම් නොපාන රථවාහන බැහැර කිරීම:-

හිමිකම් නොපාන රථවාහන ද ඉහත අධිකරණ අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති තත්කාලයේ බලපවත්නා ප්‍රතිපාදන අනුගමනය කිරීමෙන් බැහැර කිරීම සිදු කල යුතු වේ.

ඒ සම්බන්ධයෙන් 2016 අංක 18 දරණ සංශෝධන පනතින් සංශෝධිත අපරාධ නඩු විධාන සංග්‍රහයේ 432, 432(අ) වගන්තිවල ප්‍රතිපාදන අදාල වේ. (පිටපතක් මෙයට අමුණා ඇත.)

එසේ බැහැර කිරීමේ දී ද වාහනයේ අනන්‍යතාවය සනාථ වන ආකාරයෙන් ඡායාරූප ගත කිරීමත් එහි එන්ජින් අංකය, චැසි අංකය, ලියාපදිංචි අංකය පිළිබඳව පැහැදිලි විස්තර භාණ්ඩ ලේඛනයේ සටහන් කර තැබීමත් සිදු කරන බවට වගබලා ගත යුතු වේ. එම සෑම ඡායාරූපයක් පිටුපසම එම ඡායාරූප ගන්නා ලද

හැනැත්තාගේ නම/තනතුර සහ ඡායාරූප ගන්නා ලද දිනයද, එය අධීක්ෂණය කරන ලද රෙජිස්ට්‍රාර්වරයාගේ ඉහත පරිදි වූ විස්තරද, නඩු අංකය ද නොමැකෙන ලෙස සටහන් කල යුතු වේ.

ඉහත පරිදි ක්‍රියා කිරීමට පෙර අදාල වාහනයට හිමිකමක් ඇති තැනැත්තෙකු සොයා ගැනීමට හැකි සෑම පියවරක්ම අධිකරණය විසින් ගතයුතු අතර, ඉහත කී ප්‍රතිපාදන අදාල කරගත යුතු වන්නේ හිමිකම්පාන තැනැත්තකු නොමැති බවට මහේස්ත්‍රාත්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක දී පමණි.

**1.6 දැනට අධිකරණයේ පවතින කිසිදු නඩුවකට හෝ නඩු කටයුත්තකට සම්බන්ධතාවයක් ගලපා ගත නොහැකි රථවාහන බැහැර කිරීම:-**

ඉහත පරිදි වූ රථවාහන යම්කිසි නඩුවකට සහ/හෝ නඩු කටයුත්තකට සම්බන්ධයක් නොමැති බවට අදාල පොලිසිය/පොලිසි මගින් ලිඛිතව සනාථ කර ගැනීමට කඩිනමින් ක්‍රියා කල යුතු වේ.

ඉහත පරිදි සනාථ කිරීම ලබා ගත් පසුව සහ ඒවායේ ලියාපදිංචි අයිතිකරු/පරම අයිතිකරු පිළිබඳව මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් තොරතුරු ලබා ගෙන එසේ අනාවරණය වන අයට බැහැර කිරීම කල යුතු වේ. එසේ බැහැර කිරීමේ දී ද එම රථවාහනවල අනන්‍යතාවය සනාථ වන පරිදි ඡායාරූප ගත කර එම ඡායාරූප සුරැකිව වෙනම ගොනුගත කර, එන්ජින් අංකය, චැසි අංකය හා ලියාපදිංචි අංකය පිළිබඳ විස්තරද සටහන් කොට එම ඡායාරූප සමඟම සුරැකිව ගොනුගත කිරීම, බැහැර කිරීමට පූර්වයෙන් කල යුතු වේ.

**1.7 රථවාහනයක් වශයෙන් බැහැර කල නොහැකි අබලි ද්‍රව්‍ය (scrap) වශයෙන් බැහැර කල හැකි වාහන (එකලස් කරන ලද වාහනද ඇතුළුව) බැහැර කිරීම:-**

ඉහත පරිදි අබලි ද්‍රව්‍ය (scrap) වශයෙන් පමණක් බැහැර කල හැකි වාහන නඩු විභාගය අවසාන වන තෙක් අධිකරණයේ රඳවා ගැනීම අවශ්‍ය වන නිසා එවැනි නඩුවලට ප්‍රමුඛතාවය දී එදිනෙදා විභාගයට ගෙන කඩිනමින් අවසන් කර ඒ අනුව සුදුසු පරිදි බැහැර කිරීම කල යුතු වේ.

## 02. දැව.

2.1 (අ) **රාජසන්තක කරන ලද දැව බැහැර කිරීම.**

රාජසන්තක කරන ලද දැව එසේ රාජසන්තක කල වහාම දැව සංස්ථාවට භාරදීමට කටයුතු කිරීමෙන් බැහැර කිරීම කල යුතු වේ.

(ආ) **නඩුව පවතින අතරතුරදී දැව බැහැර කිරීම.**

නඩු භාණ්ඩයක් වශයෙන් "දැව" අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේ සිට ඒවා දීර්ඝ කාලයක් අධිකරණයේ තබා ගැනීමෙන් ඒවා දිරා පත් වීම හේතුවෙන් නඩු විභාගය අවසන් වන විට එහි වටිනාකම බොහෝ සෙයින් ක්ෂයවීමක් සිදු වේ. එවැනි තත්වයන් යටතේ දී නඩු විභාගය අවසානයේ දී ප්‍රශ්නගත දැව ආපසු මුදා හැරීමට නියෝගයක් නිකුත් කලද, එහි ප්‍රායෝගික හා/හෝ මූල්‍යමය වටිනාකම නොමැති තරම් විය හැකි වේ. එම නිසා දැව වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා දැව අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදීම, දැව සංස්ථාව මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා දැව සංස්ථාවේ මෙහෙයුම් ගාස්තු අඩු කර, ඉතිරි මුදල නඩුවේ බැරට වෙනම ගිණුමක තැන්පත් කිරීමට නියෝගයක් නිකුත් කිරීම යෝග්‍ය වේ.

එසේ නඩුව පවතින අතරතුරදී දැව සම්බන්ධයෙන් ඉහත පරිදි ක්‍රියා කරන විට, රාජ්‍ය දැව සංස්ථාව මගින් එම දැව භාර ගැනීමේ දී ලබා දෙනු ලබන දැව පිළිබඳ විස්තරය අඩංගු ලේඛනය නඩු වාර්තාවේ සටහන් යොදා සුරක්ෂිතව නඩුවට ගොනු කල යුතු අතර, රාජ්‍ය දැව සංස්ථාවට එම දැව භාරදීමට ප්‍රථමයෙන් නඩු භාණ්ඩ භාරකරු විසින් හා/හෝ භාණ්ඩ භාර රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී ප්‍රශ්නගත දැව ප්‍රමාණය, එහි විශේෂ ලක්ෂණ, මුද්‍රා ආදිය පැහැදිලිව නිරූපනය වන ආකාරයෙන් ඡායාරූප ගත කිරීම සිදු කල යුතු වේ. එසේ ලබා ගන්නා ඡායාරූප සියල්ලෙහිම පිටුපස එම ඡායාරූප ලබා ගන්නා ලද නිලධාරියාගේ සහ අධීක්ෂණය කල නිලධාරියාගේ විස්තරයද, නඩු අංකයද සටහන් කොට නඩු වාර්තාවට ගොනු කොට තැබීමට පියවර ගත යුතු වේ.

2.2 දැව අපරාධවලට සම්බන්ධ උපකරණ (දැව ඉරුම් පට්ටල වැනි) බැහැර කිරීම

මෙ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්ගේ ජේඑස්සී/එස්ඊසී/එම්අයිඑස්සී/2011 හා 2011.09.26 දිනැති චක්‍රලේඛ ලිපිය අදාල වේ.

(එහි පිටපතක් මීට අමුණා ඇත.)

## 3. රාජසන්තක කරන ලද හෝ හිමිකම් නොපාන මත්පැන් සහ ඒවාට අදාල බහාලුම්

3.1 මත්පැන් නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කරන සෑම ඇසුරුමකම එම නඩුවට අදාලව චෝදක පාර්ශවය වන පොලිස් ස්ථානය නැතහොත් සුරාබදු කාර්යාලය නිරූපනය වන සේද, අදාල පී.ආර්. අංකය සහ නඩු අංකය පැහැදිලිව නිරූපනය වන සේද, ඒ සෑම ඇසුරුමකම නොමැකෙන තීන්තෙන් මෙම චක්‍රලේඛයේ ආරම්භයේ දී දක්වා ඇති පරිදි වූ කේත අංකයක් සටහන් කිරීමෙන් පසුව පමණක් එම නඩු භාණ්ඩ භාර ගන්නා බවට වගබලා ගත යුතු වේ.

3.2 නීතිවිරෝධී මත්පැන් සම්බන්ධයෙන් සුරාබදු ආඥා පනත යටතේ නඩු පවරා ඇති විට මුල් අවස්ථාවේදීම අදාල චූදිත/චූදිතයන් වරද පිළි ගැනීමේ උත්තරවාද ඉදිරිපත් කර, ඒ අනුව නඩු කටයුතු අවසන් කර නඩු භාණ්ඩ වන මත්පැන් විනාශ කිරීමට නියෝග කරන විට එසේ නියෝග කරන දිනයේම (එදිනම) එම සියළු නීතිවිරෝධී මත්පැන් මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ විනාශ කිරීමට මහේස්ත්‍රාත්වරයා විසින් නොපමාව පියවර ගත යුතු වේ.

3.3 ඉහත 3.2 පරිදි වරද පිළි ගැනීමේ උත්තරවාදයක් ඉදිරිපත් නොකොට, නිවැරදිකරු බවට උත්තරවාදයක් ඉදිරිපත් කර ඇති විට හා විශාල පරිමාවලින් (බැරල්/බූලි යනාදී වශයෙන්) මත්පැන් නඩු භාණ්ඩ වශයෙන් අධිකරණයට ඉදිරිපත් කර ඇති විට එම වෙන් වෙන් සෑම බහාලුමකටම අදාල වූ සාම්පලය සම්බන්ධයෙන් මූලික සාක්ෂි මෙහෙයවීමෙන් අනතුරුව එසේ මූලික සාක්ෂි මෙහෙයවන ලද දිනයේදීම, එම සාම්පල පමණක් රඳවා තබා ගෙන එම බහාලුම්වල අඩංගු අනෙකුත් සියළු නීතිවිරෝධී මත්පැන් මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ නොපමාව විනාශ කිරීමට පියවර ගත හැකි වේ. එසේ විනාශ කරන විට එම විනාශ කරන

මත්පැන් පරිමාව/ප්‍රමාණය පිළිබඳව අනිවාර්යයෙන්ම මහේස්ත්‍රාත්වරයා විසින් නඩු වාර්ථාවේ සටහන් තැබිය යුතු අතර, එම පරිමාවන්/ප්‍රමාණයන් සම්බන්ධයෙන් සැකකාර/චූදිත පාර්ශවයන් විසින් යම් විරෝධතා ඉදිරිපත් කරනු ලබයි නම්, එම විරෝධතාද එපරිද්දෙන් සටහන් කල යුතු වේ.

නිවැරදිකරු බවට උත්තරවාද ඉදිරිපත් කරන සෑමවිටකම ඉහත පරිදි වූ බහාලුම්/ඇසුරුම් සංඛ්‍යාව, ඒවායේ විශේෂ ලක්ෂණ, හැඩරුව ආදිය නිරූපනය වන ආකාරයෙන් ද, මීට ඉහතින් සඳහන් කරන ලද පී.ආර්. අංකය, නඩු අංකය යනාදී අංකනය කිරීම් පැහැදිලිව නිරූපනය වන ආකාරයෙන් ද, නඩු භාණ්ඩ භාර රෙජිස්ට්‍රාර් හෝ නඩු භාණ්ඩ භාරකරු විසින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් ඉදිරියේ දී එම බහාලුම් සියල්ලම ඡායාරූප ගත කිරීමට වගබලා ගත යුතු වේ. එසේ ලබා ගන්නා ඡායාරූප නඩු වාර්තාවට ගොනු කල යුතු අතර, එම සෑම ඡායාරූපයක් පිටුපසම එම ඡායාරූපය ගන්නා ලද තැනැත්තාගේ නම/තනතුර සහ ඡායාරූපය ගන්නා ලද දිනයද, එය අධීක්ෂණය කරන ලද රෙජිස්ට්‍රාර්වරයාගේ ඉහත පරිදි වූ විස්තරද, නඩු අංකයද සටහන් කල යුතු වේ. තවද ඉහත පරිදි විශාල පරිමාවලින් මත්පැන් නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කරන විට හැකි සෑම අවස්ථාවකදීම එම නඩු භාණ්ඩවල පරිමා හා අනන්‍යතාව පිළිබඳව වූ පිළිගැනීම 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන අනුගමනය කරමින්, නඩුව ආරම්භයේදීම සටහන් කිරීමට හැකියාවක් ඇත්දැයි විමසා බැලීමට මහේස්ත්‍රාත්වරයා විසින් පියවර ගැනීම අකපසු නොකළ යුතුය.

3.4 ඉහත 3.3 පරිදි ක්‍රියා කිරීමේ දී විශාල පරිමාවලින් අත්අඩංගුවට ගත් මත්පැන් හි අදාල සාම්පලය/සාම්පල පමණක් රඳවා ගෙන ඉතිරිය විනාශ කරන විට එම නඩු භාණ්ඩ අධිකරණයට භාරදීමෙන් උපරිම වශයෙන් සති 01 ක් ඇතුලත ඒවා එසේ විනාශ කරන බවටත්, උපරිම වශයෙන් සති 06 ක් ඇතුලත ඒවාට අදාල බහාලුම් සියල්ල ප්‍රසිද්ධ වෙන්දේසියේ සහ/හෝ ප්‍රාදේශීය වෙන්දේසියේ විකුණා (අදාල චක්‍රලේඛවල විධිවිධාන අනුගමන කිරීමෙන්) බැහැර කිරීමටත් මහේස්ත්‍රාත්වරයා වගබලා ගත යුතු වේ.

3.5 ඉහත 3.1 - 3.4 ප්‍රතිපාදන අදාල වන්නේ සුරාබදු ආඥා පනත යටතේ වූ නඩු පැවරීම් සඳහා පමණකි.

## 4. වැලි, බොරළු හා පස්

### 4.1 වැලි

**රාජසන්තක කරනු ලබන වැලි :-**

4.1 (අ) අධිකරණ අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලබන තත්කාලයේ බලපවත්නා ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් රාජසන්තක කරන ලද වැලි පූජනීය ස්ථානවලට සහ රාජ්‍ය ආයතනවලට ලබාදීමෙන් බැහැර කිරීම.

හා/හෝ

(ආ) එම මහේස්ත්‍රාත් අධිකරණය අයත් වන <u>මහාධිකරණයේ ප්‍රසම්පාදන කමිටුව</u> විසින් තීරණය කරනු ලබන අවම මිල ගණන් යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් ද, එම රාජසන්තක කරන ලද වැලි බැහැර කිරීම කළ හැකි වේ. ප්‍රසම්පාදන කමිටුව විසින් අවම මිල ගණන් තීරණය කිරීමේ දී ඉහත (අ) හි සඳහන් කරන ලද තත්කාලයේ බලපවත්නා ලෙසට අධිකරණ අමාත්‍යාංශය මගින් නියම කරනු ලබන මිල ගණනක් වේ නම් ඒ පිළිබඳව සැලකිලිමත්වීමට වගබලා ගත යුතු වේ.

(ඇ) ඉහත දක්වා ඇති කවර ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමෙන් වුවද, රාජසන්තක කරන ලද වැලි බැහැර කළ හැකි අතර, එකී වැලි නඩු භාණ්ඩ වශයෙන් අධිකරණයට භාරදීමේ දින සිට හෝ භාරයට ගත් දින සිට මාස 01 ක කාලයකට නොවැඩි කාලයක් අධිකරණ භාරයේ රඳවා ගැනීම කිසිසේත් නොකළ යුතු වේ.

**නඩුව පවතින අතරතුරදී බැහැර කිරීම :-**

(ඇ) නඩුව පවතින අතරතුර (චූදිත විසින් නිවැරදිකරු බවට උත්තරවාද ඉදිරිපත් කර ඇති විටක) නඩු භාණ්ඩ වශයෙන් පවතින වැලි, කාලගුණික බලපෑම් හා වෙනත් හේතූන් නිසා එම වැලි ප්‍රමාණය අඩුවීම සහ එහි ගුණාත්මක භාවය හීනවීමට ඇති අවධානම ද, නඩු විභාගය අවසන් වන තෙක් එම වැලි අධිකරණ භූමියේ හෝ අධිකරණය භාරයේ ගබඩා කර තැබීම ප්‍රායෝගික නොවීමද, යන සියලු කරුණු සමස්ථයක් ලෙසට සැලකූ කල එම වැලි නඩු විභාගය පවතින අතරතුරදී විකුණා දැමීමට හේතු ඇත්නම් මහේස්ත්‍රාත්වරයා විසින් ඒ බව වාර්තාගත කොට ඉහත 4.1 (ආ) හි

සඳහන් ආකාරයෙන් <u>පමණක්</u> ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එපරිද්දෙන් ලැබෙන මුදල නඩු කටයුතු අවසන් වන තෙක් නඩුවේ බැරට බැර කිරීමට පියවර ගත යුතු අතර, නඩු විභාගය අවසානයේ දී එසේ බැර කරන ලද මුදල නියමිත නඩු භාණ්ඩය (වැලි) ලෙස සලකා ඒ සම්බන්ධයෙන් සුදුසු නියෝග නිකුත් කල යුතු වේ.

4.2 බොරළු හා පස්

**රාජසන්තක කරනු ලබන බොරළු හා පස් :-**

4.2 (අ) රාජසන්තක කරනු ලබන නඩු භාණ්ඩ වන බොරළු හා පස් ද අදාල මහාධිකරණයේ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරනු ලබන මිල ගණන් පාදකකොට ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් බැහැර කල හැකි වේ.

**නඩුව පවතින අතරතුරදී බැහැර කිරීම :-**

(ආ) නඩුව පවතින අතරතුර (චූදිත විසින් නිවැරදිකරු බවට උත්තරවාද ඉදිරිපත් කර ඇති විටක) නඩු භාණ්ඩ වශයෙන් පවතින බොරළු හා පස්, කාලගුණික බලපෑම් හා වෙනත් හේතුන් නිසා එම බොරළු හා පස් ප්‍රමාණය අඩුවීම සහ එහි ගුණාත්මක භාවය හීනවීමට ඇති අවධානම ද, නඩු විභාගය අවසන් වන තෙක් එම බොරළු හා පස් අධිකරණ භූමියේ හෝ අධිකරණය භාරයේ ගබඩා කර තැබීම ප්‍රායෝගික නොවීමද, යන සියලු කරුණු සමස්ථයක් ලෙසට සැලකු කල එම බොරළු හා පස් නඩු විභාගය පවතින අතරතුරදී විකුණා දැමීමට හේතු ඇත්නම් මහේස්ත්‍රාත්වරයා විසින් ඒ බව වාර්තාගත කොට ඉහත 4.1 (ආ) හි සඳහන් ආකාරයෙන් පමණක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එපරිද්දෙන් ලැබෙන මුදල නඩු කටයුතු අවසන් වන තෙක් නඩුවේ බැරට බැර කිරීමට පියවර ගත යුතු අතර, නඩු විභාගය අවසානයේ දී එසේ බැර කරන මුදල නියමිත නඩු භාණ්ඩය (බොරළු/පස්) ලෙස සලකා ඒ සම්බන්ධයෙන් සුදුසු නියෝග නිකුත් කල යුතු වේ.

## 05. ගංජා නොහොත් cannabis sativa L

5.1 ගංජා නොහොත් cannabis sativa L නඩු භාණ්ඩයක් වශයෙන් ඉදිරිපත් කරමින් නඩු පවරා ඇති විට හා එම නඩු කටයුතු අවසන් කර එම නඩු භාණ්ඩ වන ගංජා නොහොත් cannabis sativa L විනාශ කිරිමට නියෝග කරන විට එසේ නියෝග කරන දිනයේදීම එම සම්පූර්ණ ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණයම මහේස්ත්‍රාත්වරයා ඉදිරියේදීම විනාශ කිරිමට මහේස්ත්‍රාත්වරයා විසින් නොපමාව පියවර ගත යුතු වේ.

5.2 විශාල ප්‍රමාණවලින් (කිලෝ 05 කට වැඩි බර ප්‍රමාණයකින්) ගංජා නොහොත් cannabis sativa L නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කරන විට අදාල වන නීතිමය ප්‍රතිපාදනවලට අනුව තීරණාත්මක සාධකය වන්නේ ගංජා නොහොත් cannabis sativa L හි බර ප්‍රමාණය කිලෝ 5 කට වඩා වැඩිද අඩුද යන්න වන බැවින්, ඉහත පරිදි විශාල ප්‍රමාණවලින් (කිලෝ 05 කට වඩා වැඩි බර ප්‍රමාණයකින්) එම ගංජා නොහොත් cannabis sativa L ඉදිරිපත් කරන අවස්ථාවේ දී කිලෝ 07 ක් වන ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණයක් වෙනම ඇසුරුම් කර නිසි පරිදි මුද්‍රා තබා පොලිසිය මගින් අධිකරණයට භාර කරවීමට අවශ්‍ය පියවර මහේස්ත්‍රාත්වරයා විසින් ගත යුතු වේ.

ඉනික්බිතිව එම කිලෝ 07 ක් වන ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණයෙන් සාම්පලයක් රස පරීක්ෂක වරයා වෙත යොමු කර එම කිලෝ 07 ක ප්‍රමාණය සුරක්ෂිතව අධිකරණයේ රඳවා ගෙන, එම කිලෝ 07 ට වඩා වැඩි ඉතිරි සම්පූර්ණ ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණයම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය යටතේ, භාණ්ඩ භාරකරු/භාණ්ඩ භාර රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු තරාදියක් භාවිතා කර එහි බර ප්‍රමාණය නිවැරදිව කිරා මැන ගැනීමෙන් පසු හා පහත 5.3 පරිදි ඡායාරූප ගත කිරීමෙන්ද පසු, එම ඉතිරි සම්පූර්ණ ප්‍රමාණයම මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ දී විනාශ කිරීමට ක්‍රියා කල යුතු වේ.

ඉහත පරිදි විශාල ප්‍රමාණවලින් එනම් කිලෝ 05 කට වඩා වැඩි බර ප්‍රමාණයකින් ගංජා නොහොත් cannabis sativa L දැනටමත් නඩු භාණ්ඩ වශයෙන් අධිකරණයට ඉදිරිපත් කර ඇත්නම්, එසේ ඉදිරිපත් කර ඇති සම්පූර්ණ ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණයෙහි බර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී භාණ්ඩ භාරකරු සහ/හෝ භාණ්ඩ භාර

රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු තරාදියක් භාවිතා කර කිරා මැණ ගත යුතු වේ. එසේ කිරා මැණ ගැනීමෙන් අනතුරුව සම්පූර්ණ බර ප්‍රමාණයම කිලෝ 07 ක් හෝ ඊට වැඩි වන්නේ නම්, කිලෝ 07 ක ප්‍රමාණයක් වෙනම ඇසුරුම් කොට දැනටමත් මූලික සාක්ෂි මෙහෙයවා නොමැති නම් එම කිලෝ 07 ක ප්‍රමාණයෙන් සාම්පලයක් රස පරීක්ෂකවරයා වෙත යොමු කර, එම කිලෝ 07 ක ප්‍රමාණය සුරක්ෂිතව මුද්‍රා තබා අධිකරණයේ රඳවා ගෙන හා පහත 5.3 පරිදි ඡායාරූප ගත කිරීමෙන් පසු එම කිලෝ 07 ට වඩා වැඩි ඉතිරි සම්පූර්ණ ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණයම මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ දී විනාශ කිරීමට ක්‍රියා කල යුතු වේ.

උක්ත ඡේද ප්‍රකාරව විනාශ කිරීම කරන විට, කිලෝ 07 ක ප්‍රමාණය රඳවා තබා ගැනීම, ඊට අදාලව සාම්පලය රස පරීක්ෂකවරයා වෙත යොමු කිරීම සහ විනාශ කරන ලද ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණය (බර) පිළිබඳව මහේස්ත්‍රාත්වරයා විසින් අනිවාර්යයෙන්ම නඩු වාර්තාවෙහි පුද්ගලිකවම සටහන් යෙදිය යුතු වේ. (භාණ්ඩ භාරකරු/භාණ්ඩ භාර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පිළිබඳව නඩු භාණ්ඩ ලේඛනයේ සටහන් කිරීමට අතිරේකව)

කිලෝ 05 කට වඩා වැඩි කිලෝ 07 කට වඩා අඩු බරකින් යුක්තව ගංජා නොහොත් cannabis sativa L නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කරන විට එම ඉදිරිපත් කරන සම්පූර්ණ ප්‍රමාණයම නඩු භාණ්ඩ වශයෙන් සුරක්ෂිතව තබා ගෙන, ඒ මත පදනම්ව මූලික සාක්ෂි සඳහා සාම්පල රස පරීක්ෂකවරයා වෙත යොමු කිරීමට පියවර ගත යුතු වේ.

5.3 ඉහත පරිදි විශාල ප්‍රමාණවලින් ගංජා නොහොත් cannabis sativa L නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කරන විට එසේ ඉදිරිපත් කරන සෑම ඇසුරුමකම එම නඩු කටයුත්තට අදාලව චෝදක පාර්ශවය වන පොලිස් ස්ථානය නිරූපනය වන සේද, අදාල පී.ආර්. අංකය සහ නඩු අංකය පැහැදිලිව නිරූපනය වන සේද, නොමැකෙන තීන්තෙන් මෙම චක්‍රලේඛය ආරම්භයේ දී දක්වා ඇති පරිදි වූ කේත අංකයක් සටහන් කිරීමෙන් පසුව පමණක් එම නඩු භාණ්ඩ භාර ගන්නා බවට වගබලා ගත යුතු වේ.

ඉනික්බිතිව ඉහත පරිදි වූ අංකනය කිරීම් ද එපරිද්දෙන් වූ ඇසුරුම් සංඛ්‍යාවද නිරූපනය වන පරිදි (ඇසුරුම් සංඛ්‍යාව වඩාත් නිවැරදිව සංඛ්‍යාත්මකව නිරූපනය කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා එම ඇසුරුම්වලට අනු අංක 1, 2, 3, 4 වශයෙන් ලබා දෙමින් වෙනම අංකනය කිරීම් කල හැකි වේ.) අධිකරණයේ ප්‍රධාන රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී භාණ්ඩ භාරකරු සහ/හෝ භාණ්ඩ භාර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඇසුරුම් සියල්ල ඡායාරූප ගත කිරීම කල යුතු වේ. සෑම ඡායාරූපයක් පිටුපසම ඡායාරූපය ගන්නා ලද නිලධාරියාගේ/නිලධාරීන්ගේ විස්තර ද, අධීක්ෂණය කල නිලධාරියාගේ/නිලධාරීන්ගේ විස්තරද, නඩු අංකයද පැහැදිලිව සටහන් කොට එම ඡායාරූප සියල්ල නඩු වාර්ථාවට ගොනු කිරීමට කටයුතු කල යුතු වේ.

5.4 ඉහත 5.2 සහ 5.3 පරිදි ක්‍රියා කිරීම සහ එම ක්‍රියා කල ආකාරයත්, රඳවා තබා ගත් ගංජා නොහොත් cannabis sativa L ප්‍රමාණයත් සහ විනාශ කල ප්‍රමාණයත් එම ක්‍රියාව අධීක්ෂණය කිරීමත්, ඒ පිළිබඳව සටහන් යෙදීමත් ආදිය පිළිබඳව, එයට සම්බන්ධ වූ අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයා, භාණ්ඩ භාර රෙජිස්ට්‍රාර් වරයා සහ/හෝ භාණ්ඩ භාර ලිපිකරු යන සියළුම අයවලුන් විසින් සවිස්තරව දිවුරුම් ප්‍රකාශ ලබා දිය යුතු අතර, එම දිවුරුම් ප්‍රකාශ ද නඩු වාර්ථාවට ගොනු කිරීමට පියවර ගත යුතු වේ. ඉහතින් සඳහන් කරන ලද කරුණු නිසි පරිදි අන්තර්ගත නීතිය ඉදිරියේ වලංගු දිවුරුම් ප්‍රකාශයක් ගොනු කෙරෙන බවට අදාල මහේස්ත්‍රාත්වරයා විසින් වගබලා ගත යුතු වේ.

සටහන - මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව ඡායාරූප ගත කිරීමට නියම කර ඇති සෑම අවස්ථාවකදීම එම ලබා ගන්නා ඡායාරූප මුද්‍රණය කර මෙම චක්‍රලේඛයෙන් නියම කර ඇති පරිදි නඩු වාර්තාවට ගොනු කිරීමට ක්‍රියා කිරීමට අතිරේකව, නඩු භාණ්ඩවලට අදාලව ලබා ගන්නා ඡායාරූප පමණක් ගබඩා කර තබා ගැනීමට Pen drive උපාංගයක් සහ/හෝ External hard disk උපාංගයක් සපයා ගෙන එය අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා භාරයේ සුරක්ෂිතව තබා ඩිජිටල් ක්‍රමයට ලබා ගන්නා ඡායාරූප Pen drive උපාංගයේ සහ/හෝ External hard disk උපාංගය තුල ගබඩා කර තැබීමට පියවර ගත යුතු වේ.

එච්. සංජීව සෝමරත්න.
ලේකම් - අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් ස
කොළඹ 12

2018 ක් වූ ඔක්තෝම්බර් මස [illegible] වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක :05/2013

මගේ අංකය :MOJ/E12/නා.භා./විවිධ/2013
අධිකරණ අමාත්‍යාංශය
කොළඹ 12,
2013.12. 09

සියලුම මහාධිකරණ විනිසුරුතුමන්/තුමියන්,
සියලුම දිසා විනිසුරුතුමන්/තුමියන්,
සියලුම මහේස්ත්‍රාත්තුමන්/තුමියන්,

## අධිකරණ තුළ ගොඩ ගැසී ඇති පාපැදි නියාදනය කාර්යක්ෂම කිරීම

බොහෝ අධිකරණයන්හි රාජසන්තක කරන ලද හා අයිතිකරුවන් විසින් හිමිකම් නොපාන ලද පාපැදි විශාල වශයෙන් නඩු භාණ්ඩ ලෙස ගබඩා කර ඇති බව අධිකරණ නිරීක්ෂණය කරනු ලබන අවස්ථාවල පෙනී ගොස් ඇත. මෙකී පාපැදි නියාදනය කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් ලෙස පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිමි.

1.1 නඩු අංක හඳුනාගත නොහැකිව දිරාගොස් ඇති පාපැදි වෙනම ලැයිස්තුවකට ඇතුළත් කොට, මෙහි පහත දැක්වෙන පරිදි සැදුම්ලත් ප්‍රාදේශීය තක්සේරු මණ්ඩලයේ තක්සේරුව ලබා ගෙන, ප්‍රාදේශීයව දැන්වීම් පළ කිරීමෙන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කිරීම.

1.2 අවසන් වූ නඩු වලට අදාළව, නඩු අංකය පැහැදිලිව සඳහන්ව ඇති පාපැදි , ඊට අදාළ නඩු ගොනුව පරීක්ෂා කොට, රාජසන්තක වී තිබේ ද? හෝ වෙන්දේසියේ විකිණීමට නියෝගයක් ලබා තිබේ ද? යන්න පරීක්ෂා කොට බලා, එසේ තිබේ නම්, ප්‍රාදේශීය දැන්වීම් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කිරීම.

1.3 අවසන් වූ නඩු වලට අදාළව, නඩු අංකය හඳුනාගත හැකි නමුත්, රාජසන්තක කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට නියෝගයක් ලබා නොමැති පාපැදි සඳහා, විනිසුරුතුමාගේ නියෝගය ලබාගෙන, ප්‍රාදේශීය තක්සේරු මණ්ඩලය මඟින් තක්සේරු කර වෙන්දේසි කිරීමට කටයුතු කිරීම.

2. හිමිකරුවන් හඳුනා නොගත් පාපැදි පිළිබඳව සඳහන් කරමින්, අධිකරණයේ දැන්වීම් පුවරුවෙහි සහ වෙනත් ප්‍රසිද්ධ ස්ථාන දෙකක නිවේදනයක් පළ කොට, එකී නිවේදනය පළ කළ දිනයේ සිට මාස හයක් (06) තුළ හිමිකම් පෑමට කිසිවකු ඉදිරිපත් නොවූයේ නම්, ප්‍රාදේශීය තක්සේරු මණ්ඩලය මගින් තක්සේරු කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කිරීම.

3. ඉහත දක්වන ලද වෙන්දේසි කිරීම සඳහා තීරණය කරනු ලැබූ යම් පාපැදියක, ප්‍රාදේශීය තක්සේරු කමිටුවේ තක්සේරු මිල රුපියල් දෙදහස් පන්සියය (රු.2500/-) ඉක්මවා යන්නේ නම්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 431(3) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් වෙන්දේසි කිරීමට පියවර ගැනීම.

4. ඉහත දක්වන ලද නඩු භාණ්ඩ වෙන්දේසි කිරීමට පෙර, අධිකරණ සේවා කොමිෂන් සභාවට පිටපතක්ද සහිතව, මෙම අමාත්‍යාංශයට යොමු කොට අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

5. මෙකී පාපැදි තක්සේරු කිරීම සඳහා, පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත සාමාජිකයින් තිදෙනෙකුගෙන් සැදුම්ලත් ප්‍රාදේශීය තක්සේරු මණ්ඩලයක් පත් කළ යුතුය.

- අදාළ අධිකරණයේ විනිසුරුවරයා ( සභාපති )
- අදාළ අධිකරණයේ ප්‍රධාන රෙජිස්ට්‍රාර්වරයා
- අදාළ මහාධිකරණ කලාපයේ ගණකාධිකාරවරයා හෝ එකී මහාධිකරණයේ ප්‍රධාන රෙජිස්ට්‍රාර්වරයා හෝ අධිකරණය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන තාක්ෂණ නිලධාරියකු හෝ එසේ නැතහොත් වෙනත් රජයේ ආයතනයක ඉංජිනේරුවරයකු හෝ ගණකාධිකාරීවරයෙකු හෝ තාක්ෂණ නිලධාරියෙකු.

6. මෙම චක්‍රලේඛය 2013/12/01 දින සිට ක්‍රියාත්මක වන අතර අධිකරණ සේවා කොමිෂන් සභාවේ එකඟතාව මත නිකුත් කරනු ලැබේ.

කමලිනී ද සිල්වා,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 08/2003 (11)
මගේ අංකය :MOJ/AC/21/වෙන්දේසි /පොදු/2017
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
කොළඹ 12 ,
2018.07.31

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ප්‍රාථමික අධිකරණ විනිසුරුවරුන්

**<u>රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.</u>**

රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ලෙස ඉහළ වටිනාකමින් යුතු විවිධ වර්ගවල රථ වාහන ද, (මෝටර් රථ, යතුරු පැදි, ට්‍රැක්ටර්, ත්‍රීරෝද රථ, ටිපර්, වෑන්, බස් ලොරි වැනි දෑ ) ඇතැම් වාහනවල කොටස් (ප්ලාස්ටික් ,ටයර්, බට, වාහනවල විවිධ අමතර කොටස්) හා විවිධ අම්ලී ද්‍රව්‍ය ද, ධීවර යාත්‍රා හා පාපැදි ද විශාල ලෙස දීර්ඝ කාලයක් උසාවි භූමිවල ගොඩගසා තිබීමෙන් ඒවායේ ආර්ථිකමය වටිනාකම ක්ෂය වීම හා එමගින් සිදු වන ආර්ථිකමය පාඩුව ඒවායේ හිමිකරුවන්ට මෙන්ම රටේ ආර්ථිකයට ද සිදුවන විශාල පාඩුවක් බව පෙනී යයි.

02. එබැවින් මෙම තත්ත්වයට කඩිනමින් විසඳුම් ලබා දීම අරමුණින් හා අධිකරණයන් හි නඩු භාණ්ඩ කාමරවල කදබදය හා අධිකරණ පරිශ්‍රයන් හි අප්‍රසන්න වටපිටාවක් ඇතිවීම වලක්වා ගනු වස්, රාජසන්තක කරනු ලැබූ හා හිමිකරුවන් ඉදිරිපත් නොවූ ද්‍රව්‍ය/භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා මුදල් රෙගුලාසි සංග්‍රහයේ X වැනි පරිච්ඡේදයේ 588 (4) වැනි ඡේදයෙහි සඳහන් පරිදි අඩු වශයෙන් තුන් මසකට වරක්වත් ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්වීමට අනිවාර්යයෙන් කටයුතු කළ යුතුය.

03. තව ද මෙම කාර්යය වඩාත් කඩිනම් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2003.12.10 දිනැති 08/2003 චක්‍රලේඛයේ 01 ඡේදයේ සඳහන් රු 50000/- සීමාව මෙයින් අවලංගු කරනු ලැබේ.

04. ඒ අනුව අධිකරණ වල ගොඩ ගැසී ඇති සියලුම වර්ග වල රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ රජයේ මුදල් රෙගුලාසි හා පවත්නා නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම සම්බන්ධව අමාත්‍යාංශය මඟින් වරින් වර නිකුත් කර ඇති චක්‍රලේඛයන්හි සඳහන් කරුණු ද, 08/2003 චක්‍ර ලේඛයේ 01 ඡේදය හැර එහි සඳහන් අනිකුත් කරුණු ද, නොවෙනස්ව පවතී.

05. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2018.08.15 දින සිට බල පැවැත්වේ.

ඩබ්.එම්.එම්.ආර්.අදිකාරි,
ලේකම්,
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

පිටපත් - 01. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
[redacted]
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

ලේකම් කාර්යාලය / Telephone } 2440556
ෆැක්ස් / Fax No. } 2445447
E-Mail: secretary@moj.gov.lk
දුරකථනය / Telephone } 2323022
ෆැක්ස් / Fax No. } 2320785
Web Site: www.moj.gov.lk

ටෙලිග්‍රෑම් / Tele. } අධිකරණ ලේකම් / Secretary
තැ.පෙ. / P.O. Box }
විද්‍යුත් තැපෑල / E-mail } justiceministry@...
උසාවි සංකීර්ණය, කොළඹ 12 / Superior Courts Complex, Colombo 12.


# අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சு

# MINISTRY OF JUSTICE AND PRISON REFORMS

මගේ අංකය / My No. MOJ/AC/21/2017/කොටස (1)

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018.09.11

සියලුම මහාධිකරණ /දිසා /මහේස්ත්‍රාත් හා ප්‍රාථමික අධිකරණ විනිසුරුවරුන් වෙත,

<u>රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.</u>

උක්ත කරුණට අදාළව නිකුත් කරන ලද අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 08/2003 (11) හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ අපහරණය කළ යුත්තේ වෙන්දේසි කිරීම මගින්ද, ටෙන්ඩර් කිරීම මගින්ද යන්න පිළිබඳ නිරන්තර විමසීම් සිදු කරන බැවින්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම සඳහා මෙම උපදෙස් නිකුත් කරනු ලැබේ.

03. මුදල් රෙගුලාසි සංග්‍රහයේ 588 (4) ප්‍රකාරව රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ අපහරණය කළ යුත්තේ ටෙන්ඩර් මගින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මගින් බවට සඳහන් කර ඇත. එබැවින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මගින් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ.

04. ඒ අනුව මෙම ක්‍රම 02 න් කුමන ක්‍රමවේදය හෝ අනුගමනය කර රජයට වඩාත් මූල්‍යමය ප්‍රතිලාභයක් අත්වන අයුරින් හා උපරිම විනිවිදභාවයකින් යුක්තව මෙම නඩු භාණ්ඩ අපහරණය කිරීම කළ යුතු වේ.

ඩබ්.එම්.එම්.ආර්.අදිකාරි,

ලේකම්,

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

පිටපත් 01. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

~~02. ... කොමිෂන් සභාව~~

## 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ

## XXXVIII වන පරිච්ඡේදය

### වැරදි හා සම්බන්ධ දේපළ බැහැර කිරීම

425. ....................................

432. එම කාලසීමාව ඇතුළත යම් තැනැත්තකු එම දේපළට ඇති ස්වකීය හිමිකම තහවුරු නොකරයි නම් සහ ඒ දේපළ හමු වූයේ යම් තැනැත්තකුගේ සන්තකයේ තිබී ද ඒ තැනැත්තාට ඒ දේපළ තමා විසින් නීත්‍යානුකූල ව අත්කර ගත් බව පෙන්වා දීමට නොහැකි නම් එම දේපළ රජයට සුදුස්සක් කළ හැකි පරිදි තිබිය යුතු අතර මහේස්ත්‍රාත්වරයාගේ ආඥාව යටතේ එම දේපළ විකුණනු ලැබිය හැකි ය.

මාස හයක් ඇතුළත කිසිම හිමිකම්පාන්නකු පෙනී නොසිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 2016 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2016 ඔක්තෝබර් මස 17 වැනි දින]

පාර්ලිමේන්තුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2016 ඔක්තෝබර් මස 21 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : රු. 10.00 යි.　　තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2016 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2016 ඔක්තෝබර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 44/2015

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2016 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 431 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 15 දරන පනතේ 431 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "මාස හයක් ඇතුළත" යන වචන වෙනුවට "මාස දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් දෙදහස් පන්සියයක් හෝ ඊට වැඩි වන්නේ නම්" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ එකක් හෝ ඊට වැඩි වන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තිය, එහි පැති සටහන ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තිය සංශෝධනය කිරීම.

"මාස දෙකක් ඇතුළත කිසිම හිමිකම්පාන්නකු පෙනී නොසිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 432අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියට 432අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2—PL 010024—2,861 (2016/06)

"මාස දෙකක් ඇතුළත හිමිකම සන්තකය පෙනී සිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.

432අ. (1) එම දේපළෙහි සන්තකයට හිමිකම ඇති තැනැත්තා මාස දෙකක් ඇතුළත ස්වකීය හිමිකම තහවුරු කරන අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සිතනු ලබන කොන්දේසි මත, එම දේපළ ඔහුට ආපසු භාරදෙන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතු ය:

එසේ වුව ද, එම දේපළෙහි සන්තකයට හිමිකම ඇති තැනැත්තා එම දේපළේ සන්තකය භාර ගැනීමට සමත් නොවන අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් යටතේ එම දේපළ විකුණනු ලැබිය හැකි ය.

(2) නඩුවේ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරන තුරු, එම දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම රජයට අයත් බැංකුවක තත්කාර්ය සඳහා විවෘත කර ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් දේපළෙහි සන්තකයට හිමිකම ඇති තැනැත්තා විසින් එම දේපළේ වටිනාකම ලබා ගැනීම සඳහා නියමිත ආකෘතියෙන් සහ නියමිත ආකාරයට ඉල්ලීමක් කළ යුතු අතර, නඩුවේ වර්ෂා කරන ලද තීන්දු ප්‍රකාශයට යටත්ව මුදල් ගෙවීම සිදු කළ යුතු ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් තැන්පතු ගිණුම පරිපාලනය සහ කළමනාකරණය කරන ආකාරය නියම කරමින් නියෝග සාදනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

මගේ අංකය : ජේඑස්සී/එස්ආර්සී/එම්ඇයිඑස්සී/2011

සියළුම මහේස්ත්‍රාත්වරුන් වෙත,

කුඩා භාණ්ඩ ලෙස ඇති දැව අපරාධවලට සම්බන්ධ උපකරණ නියාදනය කිරීම

යථෝක්ත කරුණට අදාලව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත එවා ඇති ඔහුගේ අංක ආ12/4/වෙත් 37/2004 සහ 2011.09.07 දිනැති ලිපිය මගින් ඉහත කරුණට අදාලව පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීම පිණිස ඔබ දැනුවත් කරන ලෙසට ඉල්ලීමක් සිදුකර ඇත.

අධිකරණයන්හි රාජසන්තක කරනු ලබන දැව අපරාධවලට සම්බන්ධ උපකරණ නියාදනය කිරීම සඳහා වෙන්දේසි කිරීමේදී එම දැව උපකරණ නැවත වරක් දැව අපරාධකරුවන් අතට පත්වීම වැළැක්වීම පිණිස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය පරිදි එම උපකරණ රාජ්‍ය දැව සංස්ථාව, කාර්මික සංවර්ධන මණ්ඩලය, රජයේ කර්මාන්ත ශාලාව, ජාතික ශිල්ප සභාව හා ශ්‍රී ලංකා යුධ හමුදාව වැනි රාජ්‍ය ආයතන විමසා භාරදිය යුතුය.

එකී ආයතන විසින් එම උපකරණ භාර ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් පමණක් මූ.රෙ. 588 න් බැහැරව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන එම භාණ්ඩ විනාශ කිරීමට පියවර ගත යුතුය.

ඒ අනුව ඉහත උපදෙස් අනුව කටයුතු කිරීම පිණිස අදාල සියළු නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස මින් දන්වමි.

සුදත් එස්.ගොපල්ලව

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

සුදත් එස්. ගොපල්ලව
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

2011 සැප්තැම්බර් මස 26 වැනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

පිටපත :- ලේකම්, අධිකරණ අමාත්‍යාංශය.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ

XXXVI වන පරිච්ඡේදය

සාක්ෂිවලට අදාළ විශේෂ විධිවිධාන

414. ...................................

පිළිගන්නා ලද කරුණු තවදුරටත් ඔප්පු කිරීම අවශ්‍ය නොවන බව.
[1988 අංක 11 § 8.]

420. (1) ලඝු ආකාරයෙන් වූ සෑම නඩු පැවරීමක් හෝ අධිචෝදනා පත්‍රයක් මත වූ සෑම නඩු විභාගයක් ආරම්භයේ දී යම් තැනැත්තකු හෝ කාරණාවක් හෝ දෙයක් හඳුනාගත් බව, හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වූ බව සහ එම පෙරෙට්ටුවේදී නිශ්චිත සාක්ෂිකරුවකු විසින් නිශ්චිත තැනැත්තකු හඳුනාගනු ලැබූ බව, යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් නිශ්චිත තැනැත්තකු ඉදිරියේ දී මුද්‍රා තබනු ලැබූ, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළ බව, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යවන ලද යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් පරීක්ෂණයෙන් සහ විශ්ලේෂණයෙන් පසු ඔහු විසින් අධිකරණය වෙත ආපසු එවනු ලැබූබව, යම් නිශ්චිත මිනුම හෝ දළ සටහන යම් නිශ්චිත තැනැත්තකු විසින් කරන ලද බව යන කරුණු ඇතුළුව විවාදයට භාජන වූ කරුණු හෝ විවාදයට භාජන වූ කරුණුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පිළිගැනීම් කිසිවක් කිරීමට චූදිත තැනැත්තා එකඟවන්නේ දැයි ඔහුගෙන් විමසීම අධිකරණයේ කාර්යය වන්නේය. තවද චූදිත තැනැත්තා විසින් එවැනි යම් පිළිගැනීමක් කිරීමට තම නීතිඥවරයාගේ මාර්ගයෙන් එකඟ වුවහොත්, අධිකරණය විසින් එම පිළිගැනීම වාර්තා කළ යුතු ය. අධිකරණය විසින්, චූදිත තැනැත්තා වෙත දණ්ඩන නියමය කරන විට, එම තැනැත්තා විසින් මේ වගන්තිය යටතේ පිළිගැනීමක් කර ඇති බව සැලකිල්ලට ගත යුතු ය.